# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,476 - 2026 පෙබරවාරි මස 13 සිකුරාදා - 2026.02.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — | අයවැය ලේඛන ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 296 | දේපළ විකිණීම් ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මාර්තු මස 06 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 පෙබරවාරි 20 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඬිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කළ ප්‍ර දේශයක් ලෙස 2023 නොවැම්බර් මස 03 දින අංක 2357 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශය පිහිටි පහත උපලේඛනයේ විස්තර කර දක්වා ඇති මාර්ගවල මධ්‍ය රේඛාවේ සිට එක් පසෙකින් මීටර් 200 බැගින් මාර්ගය දෙපසට මීටර් 400 කින් යුතු ප්‍රදේශය තුළ පිහිටි නිශ්චල දේපළ වරිපනම් බදු පැනවීම සඳහා වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමටත් එකී තක්සේරු ගත වටිනාකම මත 8% (අටක) වරිපනම් බද්දක් පැනවීමටත් එකී සීමාවට කිසියම් දේපළක කොටසක් පමණක් අයත්වන අවස්ථාවක එකී සම්පූර්ණ දේපළම වරිපනම් බදු පැනවීම සඳහා යටත් විය යුතු බවටත් 2026.01.20 දින රැස් වූ ගරු සභාව විසින් තීරණය කරන ලද බව මෙයින් මහජනතාව වෙත නිවේදනය කරමි.

### උපලේඛනය

**01.** **මාපලගම පාර වම/දකුණ**

ඇත්කඳුර ඇල්පිටිය මාර්ගයේ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආරම්භ වන සීමාවේ සිට (N 06$^{0}$ 15.302 E 080$^{0}$ 08.653') මාපලගම මාර්ගයේ තණබද්දේගම ග්‍රාම නිලධාරි වසමේ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා බල ප්‍ර දේශයේ අවසන් වන සීමාව දක්වා (වම N 06$^{0}$ 13.961' E 080$^{0}$ 10.597' ) දකුණ N 06$^{0}$ 13.918'E 080$^{0}$ 10.625')

**02.** **ඇත්කඳුර අම්පේගම පාර වම/දකුණ**

ඇත්කඳුර මංසන්ධියේ සිට (N 06$^{0}$ 14.164 E 080$^{0}$ 09.329') අම්පේගම මාර්ගයේ ඇත් කඳුර ග්‍රාම නිලධාරි වසමේ අවසන් සීමාව දක්වා (N 06$^{0}$ 13.426' E 080$^{0}$ 09.070')

**03.** **ඇත්කඳුර බටපොළ ප්‍රධාන මාර්ගය වම/දකුණ**

ඇත්කඳුර සිරිනන්දාරාම පන්සල ඉදිරිපිට මාර්ග මංසන්ධියේ සිට (N 06$^{0}$ 13.989 E 080$^{0}$ 09.416') වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවසන් වන සීමාව දක්වා (N 06$^{0}$ 13.977 E 080$^{0}$ 08.562')

**04.** **අළුත්වල පාර වම/දකුණ**

අම්පේගම මංසන්ධියේ සිට (N 06$^{0}$ 11.615' E 080$^{0}$ 08.719') අළුත්වල පාරේ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවසන් සීමාව වන වම්පසින් ගිනිදැල්මානවත්ත දක්වාත් (N 06$^{0}$ 11.142 E 080$^{0}$ 08.404') දකුණුපසින් වැලිබෝක්කුව දක්වා (N 06$^{0}$ 11.320 E 080$^{0}$ 08.404')

**05.** **ඌරමලහේන ප්‍රධාන මාර්ගය වම/දකුණ**

අළුත්වල අම්පේගම මාර්ගයේ සිට අම්පේගම මහා විද්‍යාලය අසල සිට (N 06$^{0}$ 11.491' E 080$^{0}$ 08.519') ඌරමලහේන මාර්ගයේ වම්පස (N 06$^{0}$ 11.652' E 080$^{0}$ 08.330') දක්වාත් (N 06$^{0}$ 11.823 E 080$^{0}$ 08.304') සිට අම්පේගම බටපොළ මාර්ගය සම්බන්ධවන නුවර කඩේ සන්ධිය දක්වා (N 06$^{0}$ 11.987' E 080$^{0}$ 08.452')

**06.** **බද්දේගම පාර වම/දකුණ**

අම්පේගම බටපොළ මාර්ගයේ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා සීමාව ආරම්භ වන කුසල් කන්ද ස්ථානයේ සිට (N 06$^{0}$ 12.250' E 080$^{0}$ 08.141') බද්දේගම දුන්වත්ත සභා බල සීමාව අවසන් වන ස්ථානය දක්වා (N 06$^{0}$ 10.523' E 080$^{0}$ 09.955')

මෙම නිවේදනයේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

පී. එම්. වසන්ත,
සභාපති,
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව.

2026 ජනවාරි මස 20 දින.

02-180

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.